

# ගයාන් ළඟ නතර වෙන්න හේතු තිබුනා.

-චතුරිකා පීරිස්



**මේ දවස්වල මොනවද කරන්නේ?**

අපේ 'සහේලි' නාට්‍යයේ රූපගත කිරීම් තවම කරගෙන යනවා, ඒක තමයි මේ දවස්වල කරන ලොකුම වැඩේ.තව අපේ ව්‍යාපාරික කටයුතු බලා කියාගෙන පාඩුවේ ජීවත් වෙනවා.

**විවාහය ළඟද?**

මේ අවුරුද්දේ අන්තිමට ගන්නවා.

**ඒ කියන්නේ නිශ්චිත කාළ වකවානුවක් තීරණය කරලා නැද්ද?**

ඇත්තටම මේ තියෙන වැඩ එක්ක තවම තීරණය කරලා නැහැ. එහෙම තීරණයක් ගත්ත ගමන් මාධ්‍යට කියනවා.

**විවාහය උත්කර්ෂවත් විදිහට ගන්නවද?**

එහෙම ලොකුවට ගන්න මගේවත් ගයාන්ගෙවත් ආසාවක් නැහැ. ඒත් අපේ වැඩැහිටි පාර්ශවේ නම් ආසයි වෙඩින් එක ටිකක් ලොකුවට ගන්න. ඉතින් ඒ අයගේ කැමැත්තටත් ඉඩ දෙන්න ඕනෙනේ. හැබැයි තාම තීරණයක් නැහැ. මගෙයි ගයාන්ගෙයි කැමැත්ත වෙඩින් එක ගොඩක් සිම්පල් විදියට ගන්න, බලමු ඉතින්. . . .



**ගයාන් ළග ඔය හිත නතර වෙන්න තිබුණ විශේෂත්වය මොකද්ද?**

ඔයා ළග හිත නතර වෙන්න හේතු ගොඩක් තිබුණා. ගයාන් මට ගොඩාක් ආදරෙයි, ඒක මට දැනුනා. අදටත් ඒක හොදටම දැනෙනවා. එයා මාත් එක්ක හරියට හුරතල් වෙනවා. ඒ හුරතලේට මං හරි ආසයි. අනික එයා මං ගැන හරියට හිතනවා. මට ඒක දැනෙනවා.

**ළග ඉදන් හුරතල් වෙනවා කියන එකද ආදරේ කියන්නේ?**

හුගාක් අය හිතනවා තමන්ගේ හිතේ තියෙන ආදරේ අනෙක් කෙනාට පෙන්නන එක හොද නැහැ කියලා. කෙනෙක් ළග ඡබාරුවට හුරතල් වෙන්නත් පුලුවන්. ඒත් බොරුව හැමදාම පවතින්නේ නැහැ. ආදරේ කියන්නේ එකිනෙකාට තියෙන ගෞරවය, සොයා බැලීම, පරිත්‍යාගය. එය බොළදවීම් ළග ආදරය සුන්දරව විදින්න පුලුවන්. ඒක මං ගයාන්ගෙන් විදිනවා.

**ජීවිතේ සොදුරුම කාලය කොයි වගේද?**

මේ දැන් මං ගත කරන්නේ මගේ ජීවිතේ සොදුරුම කාලය. ඇත්තමයි මං ගයාන් එක්ක හරිම ආදරෙන් ඉන්නේ. අපි දෙන්නට ටිකක් වැඩ වැඩියි. කාර්යබහුලයි. ඒත් ගයාන් හැමවෙලාවෙම මං ගැන හොයලා බලනවා.

**ජීවිතේ පසුතැවිලි වුන කාලයක් තිබුනා නේද?**

ඔව්, එහෙම කාලයක් තිබුණා. දැන් ඒ දිහා ආපහු හැරිලා බලන්නවත් මං කැමති නැහැ. මානුෂීය බැදීම් ගත්තොත් අපරාදේ කියලා පසුතැවිලි වෙන දෙයක් නැහැ. ඒත් ඒ ගෙවුනු කාලය අපරාදේ කියලා අන්නතවත් හිතිලා තියෙනවා. ඒ කාලේ අපරාදේ කියලා ගොඩක් දෙනෙක් කිව්වා. ඒත් මං ඒක ගැන හිතුවෙ නැහැ. අද වෙනකොට මට තේරෙනවා, ඒ අය මට එදා කියපු දේ හරියි කියලා.

**අද ඔයා සතුටින්ද?**

ඔව්. . . ඇත්තටම දැන් මං සතුටින් සතුට කියන දේ සල්ලි වලට ගන්න බැහැ. ඒක දැනෙන්න ඕනෙ අපේ හදවතට. ගයානුයි මායි ඉන්නේ ගොඩාක් සතුටින්. මේ මගේ සොදුරුම කාලය විදියටයි මම දකින්නේ.

බුද්ධිනී ජයවර්ධන